# නොතේරෙන සංරචක හෙවත් නොදන්නා දෙමළය

ජාත්‍යන්තර අර්බුද කණ්ඩායමේ සභාපති යැයි කියන ගැරත් එවන්ස් නම් ඕස්ට්‍රේලියානු පාරාජික දේශපාලනඥයකු පසුගියදා නීලන් තිරුචෙල්වම් අනුස්මරණ දේශනයේ දී කියා තිබුණේ ලංකාණ්ඩුවේ හමුදා වන්නියේ කොටින්ට ප්‍රතිප්‍රහාර එල්ල කළහොත් ඉන් ජාත්‍යන්තර මැදිහත්වීමකට විභවයක් ඇතිවන බව ය. උතුරේ දී ඊනියා ජාත්‍යන්තරය කොටි ආරක්ෂාකිරීමට එළඹෙන බව අප නොදැන සිටි කරුණක් නො වේ. බටහිරයන් පාරාජිකා වී දේශපාලනයෙන් විශ්‍රාම යන තැනැත්තන් හා තැනැත්තියන් ඊනියා සාම ව්‍යාපාරවල යෙදවීම අළුත්ම ප්‍රවනතාවය වී ඇත. එවන්ස්ගේ කල්ක්‍රියාව ගැන දන්නෝ ඕස්ට්‍රේලියානු වැසියෝ ය. ඒ කෙසේ වෙතත් එවන්ස් කියන්නේ බටහිරට අවශ්‍ය දෙයකි. එහෙත් මේ සම්බන්ධයෙන් ආණ්ඩුව තවමත් තම ප්‍රතිපත්තිය අනාවරණය කර නැත. රටේ ස්වෛරීභාවය ආරක්ෂාකිරීම සඳහා බටහිරයන්ට මුහුණ දෙන්නේ කෙසේ ද යන්න සම්බන්ධයෙන් පැහැදිලි ප්‍රතිපත්තියක් හා ක්‍රියාමාර්ගයක් ආණ්ඩුවට තිබිය යුතු ය. බටහිර තර්ජනය පිළිබඳ මා කොතෙකුත් සඳහන්කර ඇති බැවින් වෙනත් මාතෘකාවක් යටතේ තරමක දිර්ඝ ලිපියක් ලිවීමට අදහස් කරමි.

අප දැනර සති දෙකකට පෙර සඳහන්කළ සතිඅන්ත පුවත්පතේ කතුවරයා පසුගිය සතියෙහි එම පුවත්පතෙහි බයිලා රාශියක් කියා ඇත. මා ලියූ ලිපිය ගැන සඳහන් කරන ඔහු සුපුරුදු පරිදි තමා විසින් මවාගන්නා ලද ප්‍රතිවාදියකුට පිළිතුරු සපයයි. ඒ පිළිතුරු බයිලා මිස අන්කිසිවක් නොවේ. ඔහුගේ බයිලා අප මෙසේ සටහන්කරන්නේ විචාරශීලි පාඨකයන්ට අවශ්‍ය නම් මගේ ලිපිය නැවත කියවා ඔහුගේ බයිලාවල රඟ දැනගැනීමට ය. ඔහු ලියා ඇති වාක්‍යවල ව්‍යාකරණ ගැන හෝ නිරවුල්බව ගැන හෝ පුළුල්ව සාකච්ඡාකිරීම මෙහි දී මගේ අභිප්‍රාය නො වේ. එහෙත් පුවත්පතක කතුවරයකු වඩා නිරවුල්ව අදහස් ප්‍රකාශකිරීම වැදගත් ය. අප කුඩාකල අපේ පියා මෙන් ම ගුරුවරු ද පුවත්පත්වල කතුවැකි කියවීමට අප උනන්දු කළහ. අද ගුරුවරුන්ට හා දෙමව්පියන්ට ඇතැම් පුවත්පත් සම්බන්ධයෙන් එවැන්නක් කළහැකි ද යන්න ප්‍රශ්නයකි.

(1) බයිලා කතුවරයාට අනුව මා "සංස්කෘතිය ගැන ගණන් බැලීමේ සාධක ලෙස යොදා ගන්නේ සිංහල භාෂාව කතාකරන හා බුද්ධාගම අදහන ජනයාගේ ප්‍රමාණයෙන් ය". එහෙත් මා කියා ඇත්තේ මෙයයි. "මේ පොදු සංස්කෘතියේ ප්‍රධාන සංරචකය සිංහල බෞද්ධ වෙයි. එයට හේතුව සිංහල බෞද්ධයන් සංඛ්‍යාවෙන් වැඩිවීම නො වේ. මෙරට අවුරුදු දහස් ගණනක් තිබි මෙරටට පමණක් ආවේණික අදීන සංස්කෘතිය සිංහල බෞද්ධ වෙයි. සිංහල ක්‍රිස්තියානින් ද සංස්කෘතික වශයෙන් ගත්කල සිංහල බෞද්ධ වීම ඇරඹුණේ හැටදෙකේ වතිකානු සම්මේලනයෙන් පසුව නො වේ. අද සිංහල බෞද්ධ සංස්කෘතිය වර්ධනය කිරීමෙහි ලා සංඛ්‍යාවෙන් අඩුවුව ද සිංහල ක්‍රිස්තියානිහු ද සහභාගි වෙති. මෙය ගොඩ පිළිබඳ ප්‍රශ්නයක් නොව අදාළත්වය පිළිබඳ ප්‍රශ්නයකි". සිංහල පුවත්පතක කතුවරයකු වූ පමණින් යමකුට සිංහලෙන් ලියූ යමක් තේරුම් ගැනීමේ ශක්තිය හා සිංහලෙන් නිරවුල් ව වාක්‍යයක් ලිවීමේ හැකියාව ඇතැයි නො සිතිය යුතු ය.

(2) ඔහුට අනුව මා " යුදෙව් සංස්කෘතියට එකහෙළා විරුද්ධය. එහෙත් ජාතීන් හා ජනවර්ග නිර්ණය කිරීමට උත්සාහ දරා ඇත්තේ යුදෙව් චින්තනයේ ම තාර්කික බලයක් ලෙස සැලකිය හැකි මාක්ස්වාදී විධික්‍රමය මත පිහිටා ය". මම යුදෙව් සංස්කෘතිය හා යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය මෙන් ම ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය ද විවේචනය කරමි. එහෙත් එහි ඇති යම් යම් අංග සිංහල බෞද්ධ සංස්කෘතියට හා චින්තනයට අවශෝෂණය කිරීමට උත්සාහ කරමි. විශේෂයෙන් ම එහි වියුක්ත චින්තනය තව තවත් සිංහල බෞද්ධ චින්තනයට අවශෝෂණය කර ගත යුතු යැයි මම සිතමි. ඒ කෙසේ වෙතත් මා ජාතිය පිළිබඳ නිර්ණායක සකස් කරගන්නේ මාක්ස්වාදී විධික්‍රමය මත පිහිටා නො වේ. මා සකස් කරගෙන ඇති නිර්ණායකවලට අනුව (ඒ නිර්ණායක සංගත බව පමණක් මෙහි දී සඳහන් කරමි.) සිංහල ජාතිය ගොඩනැගීම ආරම්භ වූයේ පණ්ඩුකාභය රජු දවස යැයි මම කියමි. මාක්ස්වාදයට අනුව ධනවාදී ආර්ථිකයක් ගැන හීනෙන්වත් නොසිතූ එවැනි යුගයක ජාතියක් ගැන සිතන්නේ කෙසේ ද? මගේ නිර්ණායකවල ජාතියකට රාජ්‍යයක් තිබිය යුතු ය යන්න ද වෙයි. ජාතිය පිළිබඳ මාක්ස්වාදී (සංගතව නම් ලෙනින්වාදී) සාහිත්‍යයෙහි කියැවෙන්නේ ස්ටැලින්ගේ සූත්‍රගත කිරීම් ය. ඒ සූත්‍රගත කිරීමට අනුව පණ්ඩුකාභය රජු දවස මෙරට ජාතියක් ගොඩනැගෙමින් තිබුණු බව පෙන්වන්න.

© Prof. Nalin De Silva

(3) බයිලා කතුවරයා මෙසේ කියයි. “නලින් සිංහල ජාතියේ විකාශය ගැන කියන දේ නිවැරදි විය හැකි ය. එහෙත් පිටතින් මෙරටට පැමිණි සියලු දෙනා සිංහලයන් බවට පත් නොවූහ ”.. (ඔහුගේ මේ වාක්‍යය ගැන සඳහන් නොකර බැරි ය. මේ අනුව පිටතින් පැමිණි කිසිවකු සිංහල වී නැත. ඔහු කිවයුතුව තිබුනේ ඇතැමුන් සිංහල බවට පත් නොවූ බව ය) “සිංහලයන් අතරට පැමිණ ඔවුන් අතර ජීවත් වූ අය සිංහල බවට පත්වන විට දමිළයන් අතරට පැමිණ ඔවුන් අතර ජීවත් වූ අය දමිළයන් බවටත් පත්වූහ”. අපට ප්‍රශ්නය වන්නේ එලෙස පිටින් පැමිණි අය දෙමළවීම ඇරඹුණේ කෙසේ ද කවදා ද යන්න ය. දහතුන්වැනි සියවසට පෙර මෙරට ස්ථිර දෙමළ වාසස්ථාන නොතිබූ බව පවසා ඇත්තේ සිංහල ජාතිවාදියකු යැයි කිසිසේත්ම කිව නොහැකි මහාචාර්ය ඉන්ද්‍රපාල මහතා ය. ඒ මහතා යාපන විශ්වවිද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ පළමු මහාචාර්යවරයා විය. මුහුදු කොල්ලකරුවන් වූ ආර්ය චක්‍රවර්තීන් විසින් යාපනයේ පිහිටුවන ලද රාජ්‍යයේ ද සිංහලයන් ජීවත් වී ඇත. රටකට පිටින් පැමිණෙන පිරිස් ඒ රටේ පවතින සංස්කෘතියට අවශෝෂණය නොවන්නේ එක්කෝ ඔවුන්ට තම මුල් රට සමග දිගින් දිගට ම සම්බන්ධතා පවත්වාගෙන යාහැකි නම් ය. එසේත් නැත්නම් පැමිණි රටේ එක් ප්‍රදේශයකට (ප්‍රදේශවලට) තම අනන්‍යතාව දිගට ම පවත්වාගෙන යා හැකි ප්‍රමාණයේ පිරිසක් කෙටි කාලයක දී සංක්‍රමණය වන්නේ නම් ය. එවැනි පිරිස් තුන් වර්ගයක් මෙරටට පැමිණ ඇත. ඒ දෙමළ, මුස්ලිම් හා බර්ගර් ය. එහෙත් ඒ සංක්‍රමණවලට ඇත්තේ දහතුන්වැනි සියවසින් ඈතට යන ඉතිහාසයක් නො වේ. ඒ වන විට සිංහල ජාතිය සකස් වී බොහෝ කල් ගත වී ය. (චීන ජාතියට පසුව ලෝකයේ පැරණිම ජාතිය වන්නේ සිංහල ජාතිය බව මා කියන්නේ මා ඒ ජාතියට අයත් නිසා නොව ඒ එසේ වන නිසා ය.)

බර්ගර් හැරෙන්නට අනෙක් වර්ග දෙක පැමිණ ඇත්තේ දකුණු ඉන්දියාවෙන් ය. බර්ගර්වරුන් ගැන කියන්නට තරම් පිරිසක් අද නැත. ඔවුන්ගෙන් ඉතා වැඩි පිරිසක් ඕස්ට්‍රේලියාවට හා වෙනත් රටවලට සංක්‍රමණය වී ඇති අතර ඉතිරි වූ පිරිස් පසුගිය අවුරුදු පනහක පමණ කාලයෙහි සිංහල බවට පත්වී ඇත. බර්ගර් යන්නෙන් හඳුන්වනු ලැබුවන්ට තම අනන්‍යතාව කලක් රැකගත හැකිවූයේ ඕලන්දය (නෙදර්ලන්තය) ඇතුළු යුරෝපයේ තම මුල් රටවල් සමග සම්බන්ධකම් පවත්වාගෙන යෑමට හැකි වූ බැවින් ය. එසේ කෙළේ යටත්විජිතවාදය උපයෝගීකරගනිමින් ය. මේ යටත්විජිත සම්බන්ධකම් පවත්වාගෙන යෑමට නොහැකි වූ ද මෙරට සංස්කෘතියට අවශෝෂණය වීමට අකමැති වූ ද බර්ගර්වරු රට අත්හැර ගියහ. මුස්ලිම් ජනයාට තම අනන්‍යතාව රැකගැනීමට උපකාරී වී ඇත්තේ සිංහල බෞද්ධ රජවරු ය. සිංහල රජවරු තැන තැන සිංහලයන් අතර ස්වල්ප දෙනා වශයෙන් මුස්ලිමුන් පදිංචි කෙළේ නම් ඔවුන් මේ වන විට සිංහල වී අවසන් ය. එහෙත් තම අනනන්‍යතාව රැකගත හැකි ප්‍රමාණයේ පිරිස් වශයෙන් දිවයිනේ ඇතැම් ප්‍රදේහවල ඔවුහු පදිංචිකරනු ලැබුහ. එබැවින් ඔවුන්ට තම අනන්‍යතාව රැකගත හැකිවිය.

බයිලා කතුවරයා යැයි කියනු ලැබුව ද ඔහු කිසි දිනෙක බයිලාවක්වත් නිර්මාණය කර නැත. ඔහු නිර්මාණය කිරීමට තැත්කළ කුල බයිලාව ඔහුට සංගත ව ඉදිරිපත්කිරීමට නො හැකි ය. ඔහු කියන අනෙක් බයිලා අන් අයගේ බයිලා ය. ඔහු බයිලා කතුවරයකු වන්නේ බයිලා නිර්මාණය කරන්නකු නිසා නොව බයිලා කියන පුවත්පත් කතුවරයකු වීම නිසා ය. එහෙත් අප කලින් සඳහන්කර ඇති ආකාරයට ඔහුගේ පුවත්පත් කතුකම ගැන ද ප්‍රශ්න ඇත. ඔහුට කිසිවක් සංගතව කීමට නොහැකිබවට තවත් උදාහරණයක් වනුයේ ඔහු මෙරට මුස්ලිම් ජනයා ගැන කියන දෑ ය. මේ ඔහුගේ ලිපියෙන් උපුටාගත්තකි. “කන්ද උඩරට සිංහල රජු ඔවුන්ට (මුස්ලිමුන්ට) රැකවරණය ලබාදෙමින් ජනපද ඇතිකර ගැනීමකට ද අනුබල දුන්නේ ය. ඔවුන් සිංහල ජනතාව අතර ජීවත්වෙමින් දෙමළ භාෂාවට අතිරේකව හොඳින් සිංහල භාෂාව කතා කළ හැකි ජනතාවක් බවට පත්වුවත් සිංහල වූයේ නැත. හේතුව ඔවුන් බුද්ධාහම වැළඳ නොගැනීම ය.” මුස්ලිමුන් සිංහල නොවූයේ සිංහල රජවරුන් ඔවුන් “ ජනපදවල ” පදිංචිකිරීම නිසා මිස ඔවුන් බුද්ධාගම නොවැලඳගත් නිසා නො වේ. බයිලා කතුවරයා මේ පුනරුච්චාරණය කරන්නේ පද්මනාභන් වැනි දෙමළ ජාතිවාදීන්ගේ අදහසකි. පද්මනාභන්ලා කියන්නේ සිංහලයන් ද කලක දී දෙමළ වූ බව හා දේවානම් පියතීෂම් (තිස්ස නො වේ. තීෂම්ලා දකුණු ඉන්දියාවේ වෙත් ද?) කාලයේ දී ඇතැම් දෙමළ ජනයා බුද්ධාගම වැළඳ පාලි භාෂාවේ ආධාරයෙන් සිංහල නමින් බසක් ඇතිකර සිංහල වූ බව ය. බයිලා කතුවරයා සංගත වීම සඳහා මුවර් මුස්ලිමුන් යනුවෙන් හැඳින්වෙන්නන් ගැන පමණක් නොව මැලේ මුස්ලිමුන් ගැන ද කිව යුතු ය. සමස්තයක් ලෙස ගත්කල මැලේ මුස්ලිමුන් අද සිංහල වී ඇත. එහෙත් ඔවුන් බුද්ධාගම වැළඳගත් බවක් දැනගන්නට නැත.
(මතු සම්බන්ධයි).

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva